**ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ජාතික පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙළ කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.2 ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණය සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වෙනත් මූලධන වියදම් යටතේ මධ්‍යම සංස්කෘතික අරමුදල , රජයේ දෙපාර්තමේන්තු, විදේශ ආයතන, පෞද්ගලික පාර්ශවයන් යනාදී මාර්ගවලින් ලැබුණු මුදලින් ගවේෂණ, කැනීම්, සංරක්ෂණ ව්‍යාපෘති කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ දරා තිබුණු රු.71,488,590 ක් මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | වෙනත් ආයතන සහ පෞද්ගලික පාර්ශවයන්ගෙන් ලැබෙන ගවේෂණ,කැනීම්, සංරක්ෂණ ව්‍යාපෘති සඳහා වූ මූලධන වියදම් මූල්‍ය නොවන සංචලන වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. | ඇතුළත් කර නොතිබීමට හේතු සොයා බැලීම සඳහා අභ්‍යන්තර විගණනයට පැවරීමටත් සුදුසු නිලධාරියෙකු වෙත පැවරීමට සටහන් කර ගෙන ඇත. |
| (ආ) දෙපාර්තමේන්තුවට අයත් ප්‍රවේණිගත වත්කම් ලෙස පෞරාණික ගොඩනැගිලි හා ස්මාරක, පුරාවිද්‍යාත්මක ස්ථාන, සංරක්ෂිත ප්‍රදේශ සහ ඓතිහාසික සම්පත් හා කලා කෘතීන් අයත්වන අතර පිළිගත් ගණකාධිකරණ මූලධර්ම අනුව මෙම මිලකළ නොහැකි වත්කම්වල නාමික අගය ගිණුම්ගත කිරීම හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් මිලකළ නොහැකි ප්‍රවේණිගත වත්කම්වල අගය නාමික අගයකට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීම හෝ හෙළිදරව් කිරීම කළ යුතුය. | ප්‍රවේණිගත වත්කම් වල කෞතුක වටිනාකම හෝ නාමික අගය තක්සේරු කිරීම සඳහා රජයේ තක්සේරුකරු මඟින් හෝ විද්වත් කමිටුවක් මඟින් තක්සේරු කරවා ගැනීම කෙරෙහි අවධානය යොමුවී ඇති අතර ඒ සම්බන්ධව ක්‍රියාකිරීමට සුදුසු නිලධාරියෙකු පත් කිරීමටත් ඉන් පසු ලැබෙන නාමික අගය ගිණුම් ගත කිරීමටත් පියවර ගනු ලැබේ. |

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.102,248,110 ක් වුවද පාලන ගිණුමේ ශේෂය රු.102,939,344 ක් වුයෙන් | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය | දිගුකලක සිට පැවත එන නිරවුල් කළයුතු මෙම වෙනස කෙරෙහි විශේෂිත අවධානය යොමුකර ඇති අතර ඉදිරියේදි මෙම වෙනස හඳුනාගැනීම පිණිස විශේෂිත |

| | | |
|---|---|---|
| රු.691,234 ක් වූ වෙනස වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට සැසඳුම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අතර වෙනස නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | අවධානය යොමු කොට අතිරේක නිලධාරියෙකු යොදවා හඳුනාගැනීමට දැනට සැලසුම් කර ඇත. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ විසර්ජන (සම්මත වැය) ලෙජරය<br>මුදල් රෙගුලාසි 447 ප්‍රකාරව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි. | විසර්ජන ගිණුමේ ඉතිරිව ඇති ප්‍රතිපාදන හා බැඳී ඇති බැරකම් දැක්වෙන පරිදි ලේඛනය පවත්වා ගත යුතුය. | මු.රෙ.447 ප්‍රකාරව ඉතිරිව ඇති ප්‍රතිපාදන හා බැඳි බැරකම් කවරේද යන්න සටහන් කර ගැනීමට අදාළ විෂය භාර නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) බැරකම් පිළිබඳ ලේඛනය<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළහැකි වන පරිදි, බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | ප්‍රවර්තන වර්ෂයේ සිට අදාළ ගෙවිය යුතු බැරකම් අප්‍රමාදව ගෙවා බේරුම් කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇති අතර මින් ඉදිරියට පෙන්වා දී ඇති අඩුපාඩු අවම වනු ඇතැයි අපේක්ෂා කරමි. |
| (ඇ) හානි හා පාඩු පිළිබඳ ලේඛනය<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මු.රෙ.110 යටතේ වන ආකෘතිය ප්‍රකාරව හානි ලේඛනය පවත්වා ගත යුතුය. | ඔබගේ පෙන්වා දීම මත හානි පිළිබඳ ලේඛනයක් විවෘත කිරීමටත් එය නඩත්තු කිරීමටත්, පාඩු හානි වාර්තා ලද පසු මෙම ලේඛනයේ ඇතුළත් කිරීමටත්, ඒ අනුව මෙම ලේඛනය යාවත්කාලීන කිරීමටත් තවද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදි හෙළිදරව් වන හානි හා පාඩු නිශ්චය කරන වාර්තා ලද පසු ඒ පිළිබඳව කටයුතු කිරීම සටහන් කර ගෙන ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) චෙක්පත් ලැබීම් හා භාරදීමේ ලේඛනය<br>මුදල් රෙගුලාසි 451 ප්‍රකාරව චෙක්පත් භාරදීමේ ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එම්.83 දරන පෝරමය පරිදි චෙක්පත් ලැබීම් හා භාර දීම් සටහන් කර ගැනිමට හැකිවන පරිදි ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. | මුදල් රෙගුලාසිවල දක්වා ඇති පරිදි GAM 83 දරන පෝරමය ලබාගෙන එයට ගැලපෙන පරිදි සකස් කර ඉදිරියේදි පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබයි. |
| (ඉ) ඇප ලේඛනය<br>මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1)හි සඳහන් තොරතුරු ඇතුලත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. | ඇප ලේඛනයක් විවෘත කොට නඩත්තු කිරිමට පියවර ගැනීමට නියමිතය. මේ සඳහා ඉදිරියේදි වගකිව යුතු සුදුසු නිලධාරියෙකු පත් කිරීමට නියමිතය. |
| (ඊ) රජයේ නිලධාරීන්ට ණය හා අත්තිකාරම් ලේඛනය<br>මුදල් රෙගුලාසි 502 හා 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව විශ්‍රාම යාම, මියයෑම, සේවය හැර යෑම, සේවයෙන් පහකිරීම, යනාදී හේතුන් මත සේවයේ නොමැති සේවකයන්ගේ හිඟ ණය ශේෂයන් දැක්වෙන ණය ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 502 හා 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව අදාල ලේඛන විධිමත්ව පවත්වා ගෙන යුතුය. | විශ්‍රාම , මියගිය, සේවය හැරගිය, සේවයෙන් පහකළ නිලධාරීන් සම්බන්ධයෙන් මින් ඉදිරියට ඇතුළත් කළයුතු තොරතුරු ලබා ගැනීම පිණිස ඔවුන්ගේ වර්තමාන සේවා ස්ථාන, ස්ථිර ලිපින කාලත්‍රයාගේ නම සහ ලිපින, ඇපකරුවන්ගේ විස්තර සහ විශ්‍රාමික තොරතුරු ආදි විස්තර සහිතව ලේඛන නඩත්තු කිරීමටත් මෙලෙස දිගුකාලයක් තිස්සේ පවතින ණය ශේෂ හඳුනාගෙන මු.රෙ.502 යටතේ අවශ්‍ය ලේඛන විවෘත කිරීමටත් ණය ශේෂ අයකර ගැනීමටත් අදාළ පියවරයන් ගැනීමට සටහන් කර ගෙන ඇත. |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ----------------------- | ------------ | ------------------- |
| (අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි . | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) විගණකාධිපතිවරයා අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවක් තුල සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දිමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි විසින් සහතික වියයුතු වුවත් වාර්තාවේ 3.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි |
| (ඇ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **නීති රීති රෙගුලාසිවලට යොමුව** | | **අනුකූල නොවීම** | | |
| (අ) | 1951 අංක 28 දරන මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශනයන්ගේ පනතේ 2 වගන්තිය | මුද්‍රණය කරන සෑම පොතකම, ග්‍රන්ථයකම පිටපත් 04 ක් සංරක්ෂණය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කර තිබුණු කැලණි විහාරයේ බිතු සිතුවම් ග්‍රන්ථ 02 හි පිටපත් සංරක්ෂණය සඳහා යොමු කර නොතිබුණි. | මුද්‍රණය කරනු ලබන සෑම ග්‍රන්ථයක පිටපත් 4 ක් සංරක්ෂණ සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුය. | මුද්‍රණය කරන සෑම පොතක්ම ඉදිරියේදී ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කිරීමට හා කැළණි විහාරයේ බිතුසිතුවම් ග්‍රන්ථ දෙකෙහි පිටපත් සංරක්ෂණය කිරීම සඳහා පියවර ගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතනසංග්‍රහයේ XXXIII පරිච්ඡේදයේ 1.1 හා 1.4 වගන්ති | ගිවිසුම්වල නීත්‍යානුකූලභාවය පිළිබඳව නීතිපතිවරයාගේ උපදෙස් විමසීමෙන් තොරව ගවේෂණ හා කැණීම් ව්‍යාපෘති කටයුතු සඳහා බාහිර පාර්ශව සමඟ ගිවිසුම්වලට එළඹී තිබුණි. | ගිවිසුම්වලට එළඹීමට ප්‍රථම ඒවායේ නීත්‍යානුකූලභාවය පිළිබඳ නීතිපතිවරයාගෙන් උපදෙස් ලබා ගත යුතුය. | මින් ඉදිරියට දෙපාර්තමේන්තුවේ නිති නිලධාරීන්ට මේ පරිදි ගිවිසුම් වලට එළඹීමට කටයුතු කරන ලෙසට උපදෙස් දීමට නියමිතය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | 2019 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකළ යුතුය. | ඔබගේ පෙන්වා දීම මත මෙහි කටයුතු නිම කරන ලෙසට වගකිව යුතු නිලධාරින් දැනුවත් කර ඇත. |
| (ඈ) | 1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනත හා ඒ හා සම්බන්ධව අංක 1572/4 හා 2008 ඔක්තෝබර් 20 දින ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය | කාත්තන්කුඩි මුස්ලිම්වරුන්ගේ උරුම කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ ලෙස සැලකීමට නොහැකි භාණ්ඩ ප්‍රදර්ශනය කර තිබුණු බව නිරීක්ෂණය විය. උදා:- එම කෞතුක භාණ්ඩ අයත් කාල සීමාව ආදී තොරතුරු දක්වා නොතිබුණි. | කෞතුක භාණ්ඩවල කාලවකවානු විද්‍යාත්මක සාධක මගින් තහවුරු කරගත් පසු අදාළ කෞතුක භාණ්ඩ ප්‍රදර්ශනය කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් සඳහා මුළු ශුද්ධ වෙන් කිරීම රු. මිලියන 112.4 ක් වූ අතර මුළු තථ්‍ය වියදම රු. මිලියන 85 ක් වූයෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 27.4 ක ඉතිරියක් වූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 24.5 ක් විය. | මූලධන වියදම් යනු සංවර්ධන කටයුතු සඳහා වූ වියදම් බැවින් එම මුදල් උපරිම ලෙස උපයෝජනය කළ යුතුය. | භාණ්ඩාගාරය විසින් විටින් විට පනවනු ලැබූ වියදම් කිරීමේ සීමා මත මෙසේ ඉතිරිවීමට බලපා ඇත. |

**2.2** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**---------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වැය විෂයයන් 06 කට අදාළව බැරකම් එකතුව වූ රු.2,782,506 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | බැරකම් 6 ක එකතුව වූ රු.2,782,506 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. | බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියේදී හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි. |

**2.3** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

**---------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) 2011 පෙබරවාරි 02 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පුරාවිද්‍යා ස්ථාන ගවේෂණ, කැනීම්, නඩත්තු, සංරක්ෂණ හා කළමනාකරණය වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල උපයන ආදායමෙන් සියයට 25 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත වාර්ෂිකව සම්පාදනය කිරීමට යෝජිතව තිබුණි. එම අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් ලෙස ව්‍යාපෘති හඳුනාගෙන විධිමත් පිළිවෙත් අනුව කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. එහෙත් 2016 වර්ෂයේදී රු.මිලියන 115 ක්, 2017 වර්ෂයේදී රු.මිලියන 233 ක් 2018 වර්ෂයේදී රු.මිලියන 370 ක් හා 2019 වර්ෂයේ රු.මිලියන 341 ක් ආදී වශයෙන් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන මධ්‍යම සංස්කෘතික අරමුදලින් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණි. | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලින් ව්‍යාපෘති සඳහා සපයා දී තිබූ ප්‍රතිපාදනය වූ එකතුව රු.මිලියන 1,059 ක මුදල නිසි ව්‍යාපෘති හඳුනාගෙන විධිමත්ව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | අපේක්ෂිත ප්‍රතිපාදන සඳහා ප්‍රේෂණ ලබා නොදීම මීට බලපා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, ලංකා සංචාරක මණ්ඩලය හා ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් රු.මිලියන 68.7 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 07 ක සමස්ථ මූල්‍ය කාර්ය සාධනය රු.මිලියන 2.5 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 4 ක් පමණ විය. | විවිධ ආයතන මගින් ව්‍යාපෘති සඳහා ලබාදෙන ප්‍රතිපාදන විධිමත් සැලැස්මකට අනුව උපයෝජනය කළ යුතුය. | මෙවැනි අඩුලුහුඩුතා ඇති නොවීමට සැලසුම් කර ගන්නා ලෙසට වගකිවයුතු නිලධාරීන් දැනුවත් කර ඇත. |

## 2.4 තැන්පතු ශේෂයන්

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ ව්‍යාපෘති 18 ක කටයුතු වෙනුවෙන් ලැබුණු ප්‍රතිපාදනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරිය රු.8,559,280 ක් වූ ශේෂ නිරවුල් කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 18 කින් ඉතිරි රු.8,559,280 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | නිරවුල් කිරීමට සටහන් කරගෙන ඇත. |
| (ආ) | පුරාවිද්‍යාත්මක ස්ථාන කැනීම්, සංරක්ෂණ, අළුත්වැඩියා ව්‍යාපෘති 19 ක් වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පෞද්ගලික ආයතන, විදේශීය ආයතනවලින් ප්‍රදාන වශයෙන් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයේදී ලැබුණු අරමුදල්වලින් ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කර ඉතිරි මුදල් ශේෂය වූ රු.11,166,011 ක් නිරවුල් කිරීමෙන් තොරව දිගින් දිගටම තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | තැන්පත් ගිණුමේ රඳවා ඇති ව්‍යාපෘති 19 ක්‍රියාත්මක කර ඉතිරි වූ මුදල් ශේෂය වූ රු.11,166,011 ක් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | නිරවුල් කිරීමට සටහන් කරගෙන ඇත. |
| (ඇ) | පුරාවිද්‍යාත්මක ස්ථානවල ඉදිකිරීම් හා නඩත්තු කොන්ත්‍රාත් 5 ක ගෙවීම්වලින් රඳවාගත් රු.388,375 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර වර්ෂ 03 සිට වර්ෂ 05 දක්වා කාලයක් තිස්සේ රඳවා ගෙන තිබුණි. | පුරාවිද්‍යාත්මක ස්ථානවල ඉදිකිරීම් සහ නඩත්තු කොන්ත්‍රාත් 5 ක රඳවාගෙන ඇති රු.388,375 ක් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | නිරවුල් කිරීමට සටහන් කරගෙන ඇත. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජංගම ගිණුම් 02 ක් උතුරු මැද හා මධ්‍යම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලවල ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා විවෘත කර වර්ෂ 11 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණද, ප්‍රාදේශීය කාර්යාල සඳහා ගණකාධිකාරවරයෙකු නොවීම හේතුවෙන් ජංගම ගිණුම ආරම්භ කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | උතුරු මැද හා මධ්‍යම ප්‍රාදේශීය කාර්යාලවල ගණකාධිකාරවරයෙකු නොමැතිව පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් වසා දැමීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍ර.ග අමතරව අනුමතව පැවති ගණකාධිකාරි තනතුර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2018.06.25 දිනැති නව තනතුරක් අනුමත කර ගැනුණි. එසේ වුවද දෙපාර්තමේන්තුව තුළ පවතින රාජකාරි ප්‍රමාණය අනුව එම තනතුර දරණ නිලධාරියා ප්‍රාදේශීය කාර්යාල සඳහා යෙදවීමට හැකියාවක් නොමැති බැවින් ගණකාධිකාරි තනතුරු සංඛ්‍යාව සැළකිල්ලට ගනිමින් මෙම ජංගම ගිණුම පවත්වාගැනීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයත් ගැනීමට සැළකිල්ල යොමුවි ඇත. |
| (ආ) | මහජන බැංකුවේ මොණරාගල ශාඛාවේ ආරම්භ කළ ජංගම ගිණුම කාර්යක්ෂමව ක්‍රියාත්මක නොකිරීම් මත 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම ගිණුම අක්‍රීය තත්ත්වයේ පැවතුණු අතර 2015 ඔක්තෝබර් 23 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි එම ජංගම ගිණුම් වැසීමට කටයුතු කර නොතිබුණි. | මහජන බැංකුව මොණරාගල ශාඛාවේ ඇති අක්‍රීය ජංගම ගිණුම්, අංක 3/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව වසා දැමීමට කටයුතු කළ යුතුය. | මහජන බැංකුවේ මොණරාගල ශාඛාවේ ක්‍රියාත්මක වන ජංගම ගිණුම පින්වතුන් විසින් සැදහැති බවින් ලබා දෙන පරිත්‍යාග මත ක්‍රියාත්මක වේ. නිශ්චිත පරිත්‍යාගශීලීන් විසින් ලබාදිය යුතු බවට නියමයක් නොමැති අතර ඔවුන්ගේ මනාපය පරිදි ලැබෙන පිංකැට අරමුදල් ප්‍රමාණවත්ව ලද කල්හි ක්‍රියාත්මක වනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ එකතුව රු.219,325 ක් වූ තිඹිරිගස්යාය ශාඛාවේ චෙක්පත් 52 ක් හා මහනුවර ශාඛාවේ චෙක්පත් 21 මාස 07 සිට මාස 52 දක්වා කාලයක් ඉකුත් වී තිබුණද මුදල් රෙගුලාසි 396 (ඈ) විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඈ) පරිදි කටයුතු කළ යුතුය. | ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් පිළිබඳ අදාළ ආදායකයන්ට ලියා දැක්වීමටත් හිලව් චෙක්පත් නිකුත් කිරීමට හෝ ඔවුන් නිසි ප්‍රතිචාර නොදක්වන්නේ නම් ගෙවීම් අත්හිටුවා රජයේ ආදායමට බැර කිරීමට ඉදිරියේදි ක්‍රියාත්මක කරනු ලැබේ. |
| (ඇ) | මහජන බැංකුවේ යාපනය ශාඛාවේ පිහිටි ජංගම ගිණුම පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර එම ගිණුම වැසීම සිදු කලේ නම් ඒ පිළිබඳ විස්තරද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මහජන බැංකුවේ යාපනයේ ශාඛාවේ ගිණුම් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම හා එය වසා දමා ඇත්නම් එම විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. | මහජන බැංකුවේ යාපනය ශාඛාවේ පිහිටි ජංගම ගිණුම සම්බන්ධයෙන් යාපනය ප්‍රාදේශිය සහකාර අධ්‍යක්ෂගෙන් කරුණු විමසා ලැබෙන තොරතුරු අනුව තීරණ ගැනීමට නියමිතය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා දී තිබුණු පුරාවිද්‍යා ස්ථාන ගවේෂණ, කැණීම්, සංරක්ෂණ, නඩත්තු හා වැඩි දියුණු කිරීම් ව්‍යාපෘති 194 කින් 2019 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති 128 කට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | අමාත්‍යාංශයේ ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන විධිමත් වැඩ පිළිවෙලක් යටතේ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | 2018,2019 වර්ෂයන්හි ව්‍යාපෘති ආරම්භ කිරීමට උපදෙස් ලබාදෙන ලද්දේ ණය පදනම මත ව්‍යාපෘති ආරම්භ කර, එම බිල්පත් පියවීමේ පදනම මත ක්‍රියාත්මක කිරීමටය. එසේ ක්‍රියාකිරීමේ දී පළාත් මට්ටමේදී ගැටළු සහගත වූ බැවින් එම ව්‍යාපෘති වලින් සුළු ප්‍රමාණයක් පමණක් ක්‍රියාත්මක විය. මේ වන විට ද ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල හිඟ බිල්පත් තවමත් ගෙවීමටද ඇත. |
| (ආ) | විවිධ ව්‍යාපෘති සඳහා 2018 වර්ෂයට සලසා දී තිබුණු මුළු ප්‍රතිපාදන රු.මිලියන 370.7 කින් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 68.5 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 18 ක් විය. | ප්‍රතිපාදන වර්ෂය පුරාම විහිදී යන පරිදි ලබාගෙන ඒවා ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. | 2018,2019 වර්ෂයන්හි ජූලි සිට ප්‍රතිපාදන වෙන්වූ බැවින් ජූලි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව පමණක් ක්‍රියාත්මක කිරීමට සිදුවූ අතර එම කාලසීමාව ප්‍රමාණවත් නොවීම මත අවශ්‍ය ප්‍රතිඵල ලබා ගැනීමට ද නොහැකි විය. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 වර්ෂයේදී ව්‍යාපෘති 239 ක් සඳහා ප්‍රතිපාදන සලසා දී තිබුණ ද, ව්‍යාපෘති 27 ක කටයුතු පමණක් සම්පූර්ණ කර තිබුණු අතර සලසා දී තිබුණු රු.මිලියන 341 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 48 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වැඩ අවසන් නොකළ ව්‍යාපාති 212 ක භෞතික කාර්ය සාධනය සියයට 0 සිට සියයට 20 දක්වා වූ ඉතාමත් පහළ පරාසයක පැවතුණි. | ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට හැකිවන පරිදි සැලැස්මක් අනුව කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධව ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු මීට අදාළ වන බව සඳහන් කරමි. |

**3.2** **ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නැදිගම්විල පන්සල් භූමියේ ගැඹුරින් කැණීම් කටයුතු සිදුකළ ස්ථානවල විධිමත් පරිදි සංරක්ෂණය නොකිරීම හේතුවෙන් කැණීම් වල පස් හා මඩවලින් වැසීගොස් පැවතුණි. ශ්‍රී ලංකාවේ පවතින මෙම පෞරාණික චෛත්‍ය ගිලා බැසීම හා ඇලවීම නිසා හානි වීම් සිදුවී ඇති අතර විහාර භූමිය තුළ පස් හා ගල් ගොඩ ගසා තිබීමත්, කැනීම් නිසා ගැඹුරු ස්ථාන පැවතීමත් නිසා වන්දනා මාන කරන ජනතාවට අපහසු හා අනතුරු දායක තත්ත්වයක් උද්ගත වී තිබුණි. මේ හේතුවෙන් ඉපැරණි ඉදිකිරීම් පොළව යට තිබුණාටත් වඩා හානිකර තත්ත්වයකට පත්කර ඇති බව නිරීක්ෂණය විය. | නැදිගම්වල පන්සල් භූමිය කැණීම් කටයුතුවලින් සිදු වී ඇති පස් හා මඩ වලින් වැසී ගොස් ඇති භූමිය යථා තත්ත්වයට පත් කිරීම හා එහි පුරාවස්තු සංරක්ෂණයට වැඩ පිළිවෙලක් සකස්කර ක්‍රියාත්මක කල යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) සිතුල් පව්ව මගුල් මහා විහාරයේ කැණීම් වලින් විශාල භූමි ප්‍රමාණයක පුරාවස්තු මතු කර ගෙන තිබුණද විධිමත් සංරක්ෂණයන් සිදු කර ඉපැරණි පුරාවිද්‍යා භූමිය ආරක්ෂා කර දීමට කටයුතු කර නොතිබුණි. | සිතුල්පව්ව මඟුල් මහ විහාරයේ කැණීම් කටයුතු වලින් මතුකරගෙන ඇති පුරාවස්තු සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**3.3. කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් වාර්තාකරණයෙන් තොරව ගබඩා කර ඇති චංචල පුරාවස්තු ලේඛන ගත කිරීමේ කාර්යය ඉටු කිරීම සඳහා රු.398,146 ක ඇස්තමේන්තුවක් යටතේ 2018 අප්‍රේල් මස වැඩ ආරම්භ කර තිබුණද එහි ලේඛන ගත කිරීම් සිදුකර නොතිබුණි. | චංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ භෞතික ප්‍රගතිය සාක්ෂාත් කිරීමට කටයුතු කල යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**3.4 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 14 කට 2020 අගෝස්තු 18 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණන විමසුම්වලට අප්‍රමාදව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**4. තිරසර සංවර්ධනය අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ. | | |
| (අ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ඇගයීම සඳහා දත්ත පද්ධතියක් පිළියෙළ කළ යුතුය. | විගණන නිරීක්ෂණ වලට එකඟතාවය දක්වන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සූදානම් වීමේදී වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කළ බවට සාක්ෂි නොවීය. | ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වෙනත් රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ වලට එකඟතාවය දක්වන ලදී. |